AL/2026/22/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භූගෝල විද්‍යාව	I
புவியியல்	I
Geography	I

22 S I

පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours	අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : .....

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I** කොටස බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- **I** කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමිවේ.
- **II** කොටසේ ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- **I, II** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

	පිටුව	ප්‍රශ්න අංකය	ලකුණු
I කොටස	2	1 - 10	
	3	11 - 19	
	4	20 - 30	
	5	31 - 40	
II කොටස		1	
		2	
III කොටස		3	
		4	
		5	
		6	
එකතුව			

	සංකේත අංකය	අත්සන
1 වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අතිරේක ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

I කොටස

- එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තීන් ඉර මත** ලියන්න.

1. භූගෝලීය තොරතුරු පද්ධතියක (GIS) අඩංගු දත්ත ගබඩා කිරීමේ ආකෘති දෙක වන්නේ,
(1) දෛශික දත්ත හා අංකිත දත්ත වේ. (2) අවකාශීය දත්ත හා අවකාශීය නොවන දත්ත වේ.
(3) දෛශික දත්ත හා සිව්රැස් දත්ත වේ. (4) අවකාශීය දත්ත හා සිව්රැස් දත්ත වේ.
(5) අංකිත දත්ත හා අවකාශීය නොවන දත්ත වේ. (.....)

2. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට (GPS) අදාළ චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීම සඳහා වූ ප්‍රධාන පාලක මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කුමන ස්ථානයේ ද?
(1) කොලරාඩෝ (2) දියාගෝ ගාසියා
(3) ඇසෙන්ෂන් (4) හවායි
(5) ක්වාජලයින් (.....)

3. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ නිවැරදි ස්ථානීය තොරතුරු ලබා ගැනීම සඳහා අභ්‍යවකාශයේ රඳවා ඇති නිත්‍ය සහ හදිසි අවශ්‍යතා සඳහා යොදා ගැනෙන මුළු චන්ද්‍රිකා ගණන කීයද?
(1) 07 (2) 20 (3) 24 (4) 31 (5) 36 (.....)

4. ප්‍රදේශ දෙකක් ඒකාබද්ධ කර සකස්කර ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියමේ නම් දැක්වෙන වරණය වන්නේ,
(1) පොතුවිල් සහ කෝමාරි ලෙස ය. (2) බුත්තල සහ පානම ලෙස ය.
(3) කතරගම සහ යාල ලෙස ය. (4) මහඔය සහ පදිරිප්පු ලෙස ය.
(5) පදියතලාව සහ අම්පාර ලෙස ය. (.....)

5. ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියමක වෙරළබඩ භෞතික ලක්ෂණ තුනක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) කලපුව, බොක්ක සහ ගංදහරය (2) දූපත, ගංදහරය සහ හැඩපළු ගංගාව
(3) දියබෙන්ම, වැලි තුඩුව සහ මෝය (4) කලපුව, බොක්ක සහ හැඩපළු ගංගාව
(5) මෝය, දූපත සහ කලපුව (.....)

6. වසරක් තුළ ගෝලීය හරිතාගාර වායු ජනනය කරන විවිධ මානව ක්‍රියාකාරකම් පෙන්වීමට සුදුසු ප්‍රස්තාරික ක්‍රමය කුමක් ද?
(1) සරල රේඛා ප්‍රස්තාර (2) සක් සටහන
(3) ද්විත්ව තීරු ප්‍රස්තාර (4) පිරමීඩ ප්‍රස්තාර
(5) බහු රේඛා ප්‍රස්තාර (.....)

7. සන්තතික දත්ත සහ විච්ඡින්න දත්තවලට උදාහරණ පිළිවෙළින් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) පන්තියක දරුවන්ගේ උස සහ දිස්ත්‍රික්කයක ඇති ගම් සංඛ්‍යාව
(2) නගරයක දෛනික උෂ්ණත්වය සහ පන්තියක දරුවන්ගේ බර
(3) පන්තියක දරුවන් සංඛ්‍යාව සහ ප්‍රදේශයක ඇති වැව් සංඛ්‍යාව
(4) නගරයක මාසික වර්ෂාපතනය සහ නගරයක දෛනික උෂ්ණත්වය
(5) රටක ඇති නගර සංඛ්‍යාව සහ නගරයක දෛනික උෂ්ණත්වය (.....)

8. ස්ථානයක භෞතික සහ සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධතාව පෙන්වන සිතියම කුමක් ද?
(1) සේයා සිතියම (2) සමසංඛ්‍යා සිතියම
(3) තීන් සිතියම (4) භූ ලක්ෂණ සිතියම
(5) තේමා සිතියම (.....)

9. 1:50 000 පරිමාණයෙන් යුත් භූ ලක්ෂණ සිතියම් පත්‍රයකින් නිරූපිත සිතියම් ප්‍රදේශයේ විශාලත්වය වර්ග කිලෝමීටරවලින් (km^2) කොපමණ ද?
(1) 1 300 (2) 1 200 (3) 1 100 (4) 1 000 (5) 800 (.....)

10. මධ්‍යන්‍යයට සාපේක්ෂව දත්ත අගයයන් සමූහයක විසරණයේ ප්‍රමාණය පෙන්නුම් කරන සංඛ්‍යානමය මිනුම වන්නේ,
(1) පහළ චාතුර්ථකයයි. (2) සංඛ්‍යාතයයි.
(3) මධ්‍යස්ථයයි. (4) පරාසයයි.
(5) සම්මත අපගමනයයි. (.....)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

11. 'පෘථිවිය මතුපිට අවකාශීය විවිධත්වය' පිළිබඳ ප්‍රවේශය භූගෝල විද්‍යා අධ්‍යයනවලට හඳුන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද?
(1) අලෙක්සැන්ඩර් වොන් හම්බෝල්ට් (2) කාල් රිටර්
(3) ඇල්ෆ්‍රඩ් හෙට්නර් (4) රිචර්ඩ් හාර්ට්ෂෝන්
(5) ෆ්‍රෙඩ්රික් රැට්සෙල් (.....)

12. පළමුවන ගණයේ, දෙවන ගණයේ සහ තුන්වන ගණයේ භූ රූප පිළිවෙළින් නිවැරදිව දැක්වෙන උදාහරණ තුන වන්නේ,
(1) ආසියානු මහාද්වීපය, හිමාලය කඳු වැටිය සහ නයගරා දිය ඇල්ලයි.
(2) මිසිසිපි නිම්නය, අප්‍රිකානු මහාද්වීපය සහ අන්දීස් කඳු වැටියයි.
(3) නයගරා දිය ඇල්ල, ග්‍රෑන්ඩ් කැනියොන් සහ යුරෝපීය මහාද්වීපයයි.
(4) රොකී කඳු වැටිය, ඔස්ට්‍රේලියානු මහාද්වීපය සහ පැසිෆික් සාගරයයි.
(5) අන්දීස් කඳු වැටිය, මිසිසිපි නිම්නය සහ ඇන්ටාක්ටික් මහාද්වීපයයි. (.....)

13. ප්‍රධාන පාෂාණ වර්ග තුන ඒවායේ මූලාරම්භය අනුව නිවැරදිව වර්ගකර දැක්වෙන වරණය කුමක් ද?
(1) ආග්නේය, ගැබ්බ්‍රෝ සහ බැසෝල්ට් (2) ග්‍රැනයිට්, බැසෝල්ට් සහ අවසාදිත
(3) ස්ඵටිකරූපී, ඵෙන්ද්‍රීය සහ විපරීත (4) ආක්‍රාන්ත, නිෂ්ක්‍රාන්ත සහ අවසාදිත
(5) ආග්නේය, අවසාදිත සහ විපරීත (.....)

14. පෘථිවි ශිලා ගෝලයේ ප්‍රධාන භූ තැටි තුන නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) පැසිෆික් තැටිය, උතුරු ඇමරිකානු තැටිය සහ අප්‍රිකානු තැටිය
(2) පැසිෆික් තැටිය, අරාබි තැටිය සහ නැස්කා තැටිය
(3) කොකෝස් තැටිය, උතුරු ඇමරිකානු තැටිය සහ යුරේසියානු තැටිය
(4) පැසිෆික් තැටිය, දකුණු ඇමරිකානු තැටිය සහ කොකෝස් තැටිය
(5) ඇන්ටාක්ටික් තැටිය, නැස්කා තැටිය සහ ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය (.....)

15. බලශක්තිමය බනිජ, ලෝහමය බනිජ සහ ලෝහමය නොවන බනිජ වර්ග සඳහා උදාහරණ තුනක් පිළිවෙළින් නිවැරදිව දැක්වෙන්නේ කවර වරණයේ ද?
(1) පීට්, තෝරියනයිට් සහ මොනසයිට් (2) වැලි, මැටි සහ මැණික්
(3) යපස්, තඹ සහ මැග්නීසියම් (4) පීට්, යපස් සහ වැලි
(5) නිකල්, ක්‍රෝමියම් සහ සිලිකන් (.....)

16. රූපසටහනේ දැක්වෙන පරිදි ගංගා බාදනය හේතුවෙන් සෑදෙන භූ රූපය කුමක් ද?



(1) බියුට (2) දුර්ග
(3) ගල්වන (4) සොසිගම
(5) ලැපිස් (.....)

17. මූලාරම්භය අනුව, ගල් අඟුරු වඩාත් නිවැරදිව වර්ගීකරණය කර ඇත්තේ පහත සඳහන් කුමන පාෂාණ වර්ගයට ද?
(1) ආම්ලික ආග්නේය පාෂාණ (2) රසායනිකව අවක්ෂේප වූ අවසාදිත පාෂාණ
(3) විපරීත පාෂාණ (4) බණ්ඩජ ආග්නේය පාෂාණ
(5) ඵෙන්ද්‍රීය අවසාදිත පාෂාණ (.....)

18. භූමිකම්පා ඇතිවීමට හේතු වන්නේ,
(1) පෘථිවි පෘෂ්ඨයට යටින් ඇති පාෂාණ ක්‍රමයෙන් සිසිල් වීම ය.
(2) පෘථිවිය වටා චන්ද්‍රයාගේ භ්‍රමණය වීම ය.
(3) පෘථිවි කබොලට යටින් ඇති ගිනියම් වූ පාෂාණවල ගබඩා වී ඇති ශක්තිය හදිසියේ මුදා හැරීම ය.
(4) පෘථිවිය තුළ බනිජ අඛණ්ඩව නිර්මාණය වීම ය.
(5) පෘථිවි පෘෂ්ඨය මතුපිට ඇති ආග්නේය සහ විපරීත පාෂාණ දියවීම ය. (.....)

19. ගොඩබිම සිට මුහුදු දෙසට ඇති වෙරළබඩ පැතිකඩක කොටස් හතර පිළිවෙළින් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) පෑල වෙරළ, මොඹ වෙරළ, මෑත වෙරළ සහ ඔබ වෙරළ
(2) පෑල වෙරළ, මෑත වෙරළ, මොඹ වෙරළ සහ ඔබ වෙරළ
(3) මොඹ වෙරළ, පෑල වෙරළ, ඔබ වෙරළ සහ මෑත වෙරළ
(4) මෑත වෙරළ, ඔබ වෙරළ, පෑළ වෙරළ සහ මොඹ වෙරළ
(5) ඔබ වෙරළ, මෑත වෙරළ, මොඹ වෙරළ සහ පෑල වෙරළ (.....)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

20. 'දෝලිනා' (Doline) භූ රූපය සෑදී ඇත්තේ,
(1) සුළං ක්‍රියාකාරිත්වයෙනි. (2) කාස්ට් ක්‍රියාවලියෙනි.
(3) ග්ලැසියර බාදනයෙනි. (4) ගිනිකඳු ක්‍රියාකාරකම්වලිනි.
(5) ගංගා නිධිසාධනයෙනි. (.....)

21. 'මැග්මීය ජලය' යනු කුමක් දැයි නිවැරදිව විස්තර කරනුයේ පහත ඒවායින් කුමකින් ද?
(1) වායුගෝලයේ වාෂ්ප ලෙස දක්නට ලැබෙන ජලය
(2) පොළොව මතුපිට සිට පසට කාන්දුවන ජලය
(3) උණුදිය උල්පත්වල ඇති ජලය
(4) පොළොව කිඳාබසින ජලය
(5) අවසාදිත ස්ථර අතර තැන්පත් වන ජලය (.....)

22. ශ්‍රී ලංකාවේ 'විල්ලු' බහුලව දක්නට ලැබෙන ප්‍රදේශ මොනවා ද?
(1) ගල්ඔය, පොළොන්නරුව සහ මාඋරුඔය (2) සිංහරාජ, බණ්ඩාරවෙල සහ වැලිමඩ
(3) ආගරපතන, අඹේවෙල සහ කඳපොල (4) සෝමාවතිය, මනම්පිටිය සහ විල්පත්තු
(5) සඳතැන්න, කිකිළියාමාන සහ නකල්ස් (.....)

23. ශ්‍රී ලංකාවේ ජාතික සිතියම් සංග්‍රහයට අනුව, වික්ටෝරියා, රන්දෙණිගල සහ රන්ටැඹේ යන ප්‍රදේශ වර්ගීකරණය කර ඇත්තේ කෙසේ ද?
(1) ජාතික වනෝද්‍යාන (2) අභයභූමි
(3) ස්වභාව රක්ෂිත (4) වනාන්තර
(5) දැඩි රක්ෂිත ප්‍රදේශ (.....)

24. ස්වභාවික උපද්‍රව යටතේ 'බහු-උපද්‍රව' තත්වයක් යන්න විස්තර කරන්නේ කුමකින් ද?
(1) භූගෝලීය ප්‍රදේශ කිහිපයකට එකවර බලපාන තනි උපද්‍රවයක් ඇතිවීම
(2) එකම ප්‍රදේශයක වෙනස් උපද්‍රව දෙකක් හෝ වැඩි ගණනක් අඛණ්ඩව සිදුවීම
(3) කෙටි කාලයක් තුළ එකම ස්ථානයක එකම උපද්‍රවය නැවත නැවතත් ඇතිවීම
(4) විවිධ රටවල සමාන උපද්‍රවයක් ස්වාධීනව සිදුවීම
(5) වසර කිහිපයක් පුරා තනි උපද්‍රවයක් නැවත නැවත ඇති වීම (.....)

25. පැසිෆික් සාගරයේ මතුපිට උෂ්ණත්වය ඉහළ යාම හා සම්බන්ධ දේශගුණික සංසිද්ධියේ නම කුමක් ද?
(1) ලා-නීනා (2) දිවිවා
(3) එල්-නිනෝ (4) සුළි කුණාටුව
(5) ෆෙංගල් (.....)

26. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්ෂික වාර්තාවට අනුව 2022 දී ලෝක ජනගහනය ළඟා වූයේ කී වෙනි බිලියනය දක්වා ද?
(1) 06 (2) 07 (3) 08 (4) 09 (5) 10 (.....)

27. රටක ජනගහන ගතිකත්වයට දායක වන සාධක නුන පෙන්නුම් කරන වරණය කුමක් ද?
(1) උපත්, මරණ සහ සංක්‍රමණය (2) සාඵල්‍යතාව, සංක්‍රමණය සහ මරණ
(3) උපත්, මරණ සහ සාඵල්‍යතාව (4) වර්ධනය, සාඵල්‍යතාව සහ සංක්‍රමණය
(5) වර්ධනය, මරණ සහ සංක්‍රමණය (.....)

28. ලෝකයේ ඉහළම ජනගහන සංකේන්ද්‍රන හතර දැක්වෙන වරණය කුමක් ද?
(1) අග්නිදිග ආසියාව, බටහිර ආසියාව, මධ්‍යම ආසියාව සහ දකුණු ඇමරිකාව
(2) නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, මධ්‍යම ආසියාව සහ උතුරු ඇමරිකාව
(3) නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව සහ යුරෝපය
(4) උතුරු ආසියාව, බටහිර ආසියාව, අග්නිදිග ආසියාව සහ දකුණු අප්‍රිකාව
(5) දකුණු ආසියාව, බටහිර ආසියාව, අග්නිදිග ආසියාව සහ ඕස්ට්‍රේලියාව (.....)

29. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ග්‍රාමීය ජනාවාසවල දැකිය හැකි ප්‍රධාන මූලිකාංග තුනක් දැක්වෙන වරණය කුමක් ද?
(1) හේන, වැව සහ ග්‍රාම මධ්‍යස්ථානය (2) වැව, ගංගොඩ සහ ග්‍රාම මධ්‍යස්ථානය
(3) ගංගොඩ, කුඹුරු සහ වතු වගාව (4) ග්‍රාම මධ්‍යස්ථානය, වතු වගාව සහ කැළෑව
(5) වැව, කුඹුරු සහ ගංගොඩ (.....)

30. යුරෝපයේ 'Golden Banana' කලාපය නිවැරදිව හඳුන්වන්නේ පහත වරණවලින් කවරක් මගින් ද?
(1) ප්‍රවාහන කොරිඩෝවකි (2) ප්‍රධාන කාර්මික කලාපයකි
(3) කෘෂිකාර්මික කලාපයකි (4) කැණීම් කලාපයකි
(5) දැඩි ලෙස නාගරීකරණය වූ ප්‍රදේශයකි (.....)

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

විභාග අංකය : .....

31. වර්තමානයේ දී ප්‍රකාශිත දත්තවලට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ජනගහන ප්‍රතිශත කාණ්ඩය කුමක් ද?
(1) 30 - 39 (2) 40 - 49 (3) 50 - 59 (4) 60 - 69 (5) 70 ට වැඩි (.....)

32. කාබනික කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ලක්ෂණයක් පෙන්නුම් කරන්නේ කුමකින් ද?
(1) තිරසර ගොවිතැන කෙරෙහි අවධානය යොමු කරයි
(2) ප්‍රාග්ධන සූක්ෂම වගා ක්‍රමයකි
(3) සූක්ෂම ලෙස යාන්ත්‍රීකරණය භාවිත කරයි
(4) ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කරයි
(5) නවීන ජල කළමනාකරණය භාවිත කරයි (.....)

33. හරිත විප්ලවයේ හිතකර බලපෑමක් පෙන්නුම් කරන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) නිෂ්පාදන පිරිවැය අඩු වීම (2) සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම
(3) පසෙහි ස්වාභාවික සාරවත් බව වැඩි වීම (4) ජෛව විවිධත්වය වැඩි වීම
(5) බෝග අස්වැන්න වැඩි වීම (.....)

34. ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්මාන්තයේ මූලික ලක්ෂණයක් වන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) ඉහළ ඒක පුද්ගල ගොවිපල නිෂ්පාදනය (2) නිමැවුම දේශීය පරිභෝජනය සඳහා භාවිතය
(3) යන්ත්‍රෝපකරණ සූක්ෂම ලෙස භාවිතය (4) මහා පරිමාණයේ ඉඩම් හිමිකම
(5) ඉහළ ප්‍රාග්ධන ආයෝජනය (.....)

35. ඛනිජ තෙල් අත්‍යවශ්‍ය ස්වාභාවික බලශක්ති සම්පතක් ලෙස සැලකීමට හේතුව නිවැරදිව විස්තර කරන්නේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?
(1) එය පෘථිවියේ එක් භූගෝලීය කලාපයක පමණක් පවතියි
(2) එය සීමිත සැපයුමක් සහිත පුනර්ජනනීය සම්පතකි
(3) එය ප්‍රවාහනය සඳහා ඇති ප්‍රධාන බලශක්ති ප්‍රභවයයි
(4) එය ගෘහස්ථවල සියලුම බලශක්ති අවශ්‍යතා සපයයි
(5) එය පරිභෝජනය කරන විට හරිතාගාර වායු අඩුවෙන් නිපදවයි (.....)

36. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ප්‍රධාන කාර්මික ඛනිජ තුන වන්නේ
(1) ගල් අඟුරු, ඇපටයිට් සහ තඹ ය. (2) මීනිරන්, ඇපටයිට් සහ ඛනිජ වැලි ය.
(3) මීනිරන්, ඇපටයිට් සහ රූබි ය. (4) ඛනිජ වැලි, තඹ සහ රූබි ය.
(5) ඛනිජ වැලි, තඹ සහ ගල් අඟුරු ය. (.....)

37. ශ්‍රී ලංකාවේ වැලි සහ මැණික් කැණීම් සඳහා භාවිත කරන වළවල් ආශ්‍රිතව ඇති මානව සෞඛ්‍යයට සෘජුවම බලපාන සාධකයක් වන්නේ
(1) ජීවත් වීමට සුදුසු ඉඩම් අහිමි වීම ය. (2) නායයෑම් වැඩි වීම ය.
(3) භූගත ජලය ක්ෂය වීම ය. (4) ගංගා ජලය අපවිත්‍ර වීම ය.
(5) මදුරුවන් බෝවන ස්ථාන වැඩි වීම ය. (.....)

38. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් සඳහා කාර්මික අංශයේ දායකත්වය පෙන්නුම් කරන්නේ පහත සඳහන් ඒවායින් කවරකින් ද?
(1) 35% ට වඩා අඩු (2) 40% සහ 50% අතර
(3) 55% සහ 65% අතර (4) 70% සහ 80% අතර
(5) 85% ට වඩා වැඩි (.....)

39. සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණයෙන් ලැබෙන ප්‍රධාන ආර්ථික වාසියක් ලෙස සැලකෙන්නේ පහත ඒවායින් කුමක් ද?
(1) රටවල් ඇතුළත ආදායම් විෂමතාව වැඩි වීම
(2) විදේශ සෘජු ආයෝජන සඳහා ප්‍රවේශය වැඩි වීම
(3) ඉහළ මට්ටමේ තාක්ෂණයට වඩා පහළ මට්ටමේ තාක්ෂණය ලැබීම
(4) තරඟකාරිත්වය හේතුවෙන් දේශීය භාණ්ඩවල මිල අඩු වීම
(5) ආයෝජන භාණ්ඩවලට වඩා පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළේ තිබීම (.....)

40. ලෝකයේ කලාපීය සංවිධාන බිහිවීම පිටුපස ඇති ප්‍රධාන අරමුණක් වන්නේ
(1) කලාපයක් තුළ ඇති සංස්කෘතික අනන්‍යතා ඉවත් කිරීම ය.
(2) අසල්වැසි රටවල් කෙරෙහි හමුදා බලය ස්ථාපිත කිරීම ය.
(3) සාමාජික රටවල් අතර ඒකාබද්ධ රාජ්‍යයක් නිර්මාණය කිරීම ය.
(4) සහයෝගිතාවයෙන් කලාපීය අභියෝගවලට මුහුණ දීම ය.
(5) සාමාජික නොවන රටවල් සමඟ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම ය. (.....)

* *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භූගෝල විද්‍යාව	I
புவியியல்	I
Geography	I

22 S I

උපදෙස්:

- ✳ **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ✳ **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50 000 භූ ලක්ෂණ සිතියමක කොටසක්, ලෝක ආකෘති සිතියමක් සහ ප්‍රස්තාර කඩදාසි දෙකක් සපයනු ලැබේ.

II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ දඹුල්ල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය **මීටර 20** කි. එම සිතියම පාදක කර ගනිමින් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:

- ✳ **ප්‍රශ්නයට අදාළ අංකය** සහ අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- ✳ **භූ ලක්ෂණ සිතියමෙහි පිළිතුරු ලිවිය යුතු නොවේ.**
- ✳ සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නොවේ**.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති භූරූප ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01)

(ii) Ⓑ - Ⓒ සහ Ⓓ - Ⓔ රේඛාවලින් දක්වා ඇති භූරූප ලක්ෂණ **දෙක** අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(iii) සිතියම් ප්‍රදේශයේ Ⓕ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමන ලක්ෂණයක් ද? (ලකුණු 01)

(iv) Ⓖ සහ Ⓗ අක්ෂරවලින් දක්වා ඇති පරිපාලන මාධ්‍ය **දෙක** අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 02)

(v) කණ්ඩලම වැව් බැම්මෙහි දිග කිලෝමීටරවලින් ගණනය කර දක්වන්න. (ලකුණු 01)

(vi) Ⓚ චතුරශ්‍රය තුළ පිහිටි ඕනෑම රාජ්‍ය ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(vii) පහත සඳහන් මාතෘකා **තුන** යටතේ සිතියම් ප්‍රදේශයේ කැපී පෙනෙන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
(අ) මාර්ග ජාලය (ආ) වනාන්තර හා ලඳු කැලෑ (ඉ) ජනාවාස (ලකුණු 06)

(viii) සිතියම් ප්‍රදේශයේ වී වගාවේ ව්‍යාප්තිය පහත සඳහන් සාධක **තුනට** අදාළව සාකච්ඡා කරන්න.
(අ) උන්නතාංශය (ආ) අතු ගංගා හා අපශාඛා (ඉ) වාරි ජල සැපයුම (ලකුණු 06)

2. සම්මත වර්ණ සහ සංකේත භාවිත කර සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ සලකුණු කර නම් කරන්න.
   - නයිජර් ගඟ
   - 80°.00' E (නැඟෙනහිර දේශාංශය)
   - මධ්‍යධරණී මුහුද
   - ටිටිකාකා විල
   - රොකී කඳුවැටිය
   - බංග්ලාදේශය
   - ග්‍රීන්ලන්තය
   - ස්ටෙප් තෘණ භූමිය
   - ඕස්ට්‍රේලියාවේ අග නගරය
   - 2026 මුල් කාලයේ ඉරානය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර ඇති වූ ගැටුමේ දී නාවික ප්‍රවාහනය අවහිර කළ සමුද්‍රසන්ධිය (ලකුණු 10)

[හත්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

III කොටස

3. (i) සිතියමක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) භූ ලක්ෂණ සිතියම්වල සුවිශේෂත්වය ලක්ෂණ **දෙකක්** ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) තේමා සිතියම්වල ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iv) මුද්‍රිත සිතියම් සහ අංකිත සිතියම් අතර පවතින වෙනස්කම් **තුනක්** සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 06)

4. (i) දුරස්ථ සංවේදී දත්ත ලබාගැනීමට භාවිත කළ හැකි මූලාශ්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) දුරස්ථ සංවේදී චේදිකා වර්ග **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) සුදුසු උදාහරණ සහිතව දුරස්ථ සංවේදී තාක්ෂණයේ භාවිත **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iv) සංවර්ධන ක්‍රියාවලියේ දී දුරස්ථ සංවේදී තාක්ෂණය භාවිත කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණදෙන අභියෝග **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04)

5. ශ්‍රී ලංකාවේ 2000 - 2025 කාලය තුළ යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්න වගුව 01හි දැක්වේ. දී ඇති එම දත්ත භාවිතකර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 01 : ශ්‍රී ලංකාවේ 2000 - 2025 කාලය තුළ යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්න
(හෙක්ටයාරයකට කිලෝග්‍රෑම්වලින්)

වර්ෂය	සාමාන්‍ය වී අස්වැන්න
2000	3697
2001	4119
2002	3773
2003	3709
2004	4244
2005	3976
2006	4263
2007	4543
2008	4195
2009	4186
2010	4444
2011	4347
2012	4145

වර්ෂය	සාමාන්‍ය වී අස්වැන්න
2013	4408
2014	4204
2015	4527
2016	4417
2017	4291
2018	4683
2019	4696
2020	4770
2021	4691
2022	3407
2023	4128
2024	4599
2025	4820

මූලාශ්‍රය - *Department of Censes and Statistics, 2026*

(i) සංඛ්‍යාත බහු අස්‍රයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) පහත දැක්වෙන පන්ති ප්‍රාන්තර භාවිතයෙන් වගුව 01 හි දත්ත සඳහා සංඛ්‍යාත වගුවක් සකස් කරන්න.
(3400 - 3649, 3650 - 3899, 3900 - 4149, 4150 - 4399, 4400 - 4649, 4650 - 4899) (ලකුණු 03)

(iii) ඉහත 5 (ii) හි ඔබ විසින් සකස් කරන ලද සංඛ්‍යාත වගුව භාවිතයෙන් ජාල රේඛයක් සහ සංඛ්‍යාත බහු අස්‍රයක් නිර්මාණය කරන්න (සපයා ඇති ප්‍රස්තාර කඩදාසිය භාවිත කරන්න). (ලකුණු 08)

(iv) සංඛ්‍යාත බහු අස්‍රය මගින් පෙන්නුම් කරන පරිදි යල කන්නයේ සාමාන්‍ය වී අස්වැන්නෙහි හඳුනාගත හැකි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

[අවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

6. ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ හා පුම්තිරිබව අනුව 2025 වර්ෂයේ ජනසංඛ්‍යාව වගුව 02හි දක්වා ඇත. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 02 : වයස් කාණ්ඩ හා පුම්තිරිබව අනුව ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව - 2025 (දහස් ගණනින්)

වයස් කාණ්ඩ	පුරුෂ	ස්ත්‍රී	එකතුව
0 - 9	1 398	1 371	2 769
10 - 19	1 787	1 739	3 526
20 - 29	1 451	1 526	2 977
30 - 39	1 386	1 478	2 864
40 - 49	1 515	1 575	3 090
50 - 59	1 253	1 362	2 615
60 - 69	993	1 178	2 171
70 - 79	559	758	1 317
80+	158	269	427

මූලාශ්‍රය - *Registrar General's Department, 2025 (Estimated)*

(i) **වගුව 02** හි දක්වා ඇති ජනසංඛ්‍යා දත්ත නිරූපණය කිරීම සඳහා පිරමීඩ ප්‍රස්තාරයක් අඳින්න (සපයා ඇති ප්‍රස්තාර කඩදාසිය භාවිත කරන්න). (ලකුණු 08)

(ii) ඔබ විසින් නිර්මාණය කරන ලද ජනසංඛ්‍යා පිරමීඩ ප්‍රස්තාරය ඇසුරින් 0-19, 20-59 සහ 60 ට වැඩි වයස් කාණ්ඩ සඳහා හඳුනාගත හැකි **එක්** කැපී පෙනෙන ලක්ෂණයක් බැගින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) ඉහත ජනසංඛ්‍යා දත්ත නිරූපණය කිරීමට යොදාගත් පිරමීඩ ප්‍රස්තාරයේ වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கை பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ප්‍රශ්න අංකය
வினா இல.
Question No. 2

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

II කොටස
பகுதி II
PART II

22 STE I

විභාග අංකය
சுட்டெண்
Index No .....



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

AL/2026/22/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භූගෝල විද්‍යාව	II
புவியியல்	II
Geography	II

22 S II

පැය තුනයි	
மூன்று மணித்தியாலம்	
Three hours	

අමතර කියවීම් කාලය	-	මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	-	10 நிமிடங்கள்
Additional Reading Time	-	10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) භෞම පද්ධතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ජෛව ගෝලයේ සුවිශේෂී ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)


(iii) ජෛව ගෝලය අනෙක් උප පද්ධති තුන සමග අන්තර්ක්‍රියා කරන ආකාරය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ජෛව ගෝලයට අහිතකර ලෙස බලපාන භෞතික සාධක **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

2. (i) නිම්න ග්ලැසියර යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) කඳුකර ප්‍රදේශවල පවතින නිම්න ග්ලැසියරවල ප්‍රධාන ක්‍රියාකාරකම් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) රූප සටහන 01 හි A, B, C, D, E සහ F ලෙස සලකුණු කර ඇති නිම්න ග්ලැසියර භූ රූප **හය** නම් කරන්න. (ලකුණු 06 යි)



රූප සටහන 01

(iv) පහත සඳහන් ග්ලැසියර ආශ්‍රිත භූ රූප **තුන**, ඒවායේ පිහිටීම අනුව සුදුසු කවු සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(අ) ආංශික මොරේන (ආ) මැදි මොරේන (ඉ) අක් මොරේන (ලකුණු 06 යි)

3. (i) ආපදා කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යභාරයන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රධාන අදියර **හතර** රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ 'දිට්වා' ආපදා කාලයේ දී හා එයින් පසු රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. (i) බියෝමයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝකයේ බියෝම විවිධත්වයට බලපාන ප්‍රධාන සාධක **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝකයේ නිවර්තන වර්ෂා වනාන්තර බියෝමයේ ප්‍රධාන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් නිවර්තන වර්ෂා වනාන්තර මුහුණ දෙන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. 2017 වර්ෂය සඳහා ලෝකයේ ප්‍රධාන කලාප අනුව වයස අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය සහ 2050 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද දත්ත වගුව 01 හි දැක්වේ. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 01 : 2017 සහ 2050 සඳහා ලෝකයේ ප්‍රධාන කලාප අනුව අවුරුදු 60ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය

ප්‍රධාන කලාප	වයස අවුරුදු 60ට වැඩි වියපත් පුද්ගලයින්			
	2017		2050 (පුරෝකථනය කරන ලද)	
	මිලියන	ප්‍රතිශතය	මිලියන	ප්‍රතිශතය
අප්‍රිකාව	68.8	7.2	225.8	10.9
ආසියාව	549.2	57.1	1273.2	61.2
යුරෝපය	183.0	19.0	247.2	11.9
උතුරු ඇමරිකාව	78.4	8.1	122.8	5.9
ලතින් ඇමරිකාව සහ කැරිබියන්	76.0	7.9	198.2	9.5
ඕෂනියාව	6.9	0.7	13.3	0.6
ලෝකය	**962.3**	**100.0**	**2080.5**	**100.0**

මූලාශ්‍රය : *United Nations (2018)*

(i) වියපත් දර්ශකය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) 2017 දී ලෝකයේ ප්‍රධාන කලාපවල අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) 2017 හා සසඳන විට 2050 දී ලෝකයේ ප්‍රධාන කලාපවල අවුරුදු 60 ට වැඩි වියපත් පුද්ගලයින්ගේ ව්‍යාප්තියේ වෙනස්වීම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) වියපත් ජනගහනයේ වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

6. (i) ලෝකයේ ප්‍රධාන ජනාවාස රටා **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සවිඩි ජනාවාසවල උප බෙදීම් **තුන** උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ග්‍රාමීය ජනාවාසවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ මහවැලි ජනාවාස ධූරාවලියේ මට්ටම් **හතර** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. පහත වගුව 02 හි 2014 සහ 2022 දී ලෝක යපස් නිෂ්පාදනයේ ව්‍යාප්තිය පෙන්වයි. එම දත්ත භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 02 : 2014 සහ 2022 දී ලෝක යපස් නිෂ්පාදනය (ටොන් මිලියන)

රටවල්	ලෝක යපස් නිෂ්පාදනය			
	2014		2022	
	ටොන් මිලියන	ප්‍රතිශතය	ටොන් මිලියන	ප්‍රතිශතය
ඕස්ට්‍රේලියාව	767	32.9	880	33.9
බ්‍රසීලය	411	17.6	410	15.9
චීනය	369	15.8	380	14.6
ඉන්දියාව	129	5.5	230	8.8
රුසියාව	102	4.4	100	3.8
දකුණු අප්‍රිකාව	78	3.3	61	2.3
ඇමරිකා එක්සත් ජනපදය	58	2.5	46	1.8
ඉරානය	45	1.9	50	1.9
කැනඩාව	41	1.8	68	2.6
වෙනත් රටවල්	330	14.3	375	14.4
ලෝක එකතුව	**2 330**	**100.0**	**2 600**	**100.0**

මූලාශ්‍රය : *USGS Mineral Commodity Summaries, 2024*

(i) නිෂ්පාදන කර්මාන්ත සඳහා වැදගත් අමුද්‍රව්‍යයක් ලෙස යපස් සැලකීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) 2014 දී ලෝක යපස් නිෂ්පාදනයේ ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) 2014 ට සාපේක්ෂව 2022 දී ලෝකයේ යපස් නිෂ්පාදනයේ වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝක යපස් කැණීම් කර්මාන්තය ආශ්‍රිත ගැටලු **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

8. (i) ශ්‍රී ලංකාවට පැමිණෙන ආගන්තුකයෙකු සංචාරකයෙකු ලෙස සලකනු ලබන නිර්ණායකය සඳහන් කරන්න. (ලකුණු 02 යි)


(ii) ජාත්‍යන්තර සංචාරකයින් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා බලපාන ප්‍රධාන අරමුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සංචාරකයින්ට පිරිනමන ප්‍රධාන සංචරණ ප්‍රභේද **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා මෑත කාලීනව රජය විසින් අනුගමනය කර ඇති පියවර **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/



SCALE 1 : 50 000

සමෝච්ච පරතර අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Line Interval 20 metre

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/